OL/2017/44/S-I, II (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

44 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## නැටුම් (දේශීය) I

**විශේෂ උපදෙස් :**

* සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න **25** ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතර ව **II උඩරට** නර්තනය හෝ **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
* **II, III** හා **IV** වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව ලියා දැක්විය යුතු ය.

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

## I කොටස

* අංක **1** සිට **10** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

**1.** සරඹ අභ්‍යාස කිරීමේ දී **දෙගුණ** වශයෙන් හඳුන්වනුයේ .................................. ලයට නැටීම ය.
(1) ද්‍රැත (2) මධ්‍ය (3) විලම්භ (4) ප්ලුත

**2.** "ඉඳගත්තෙමි උස පුටුවක ගුවනා" මෙම කවිපද කොටස ............................ ගායනයට අයත් වේ.
(1) මල් යහන් (2) සිරස පාද (3) ඕංචිලිවාරම් (4) ටීකා සීපද

**3.** ජන නැටුමක් වන ............................ නැටුම සිංහල, ද්‍රවිඩ හා මුස්ලිම් ජනයා අතර වඩාත් ජනප්‍රිය නැටුමකි.
(1) ලී කෙළි (2) කොහොඹ කළය (3) බුම්මැඩි (4) වේවැල්

**4.** ගායනය **රහිත** නර්තන අංගයක් ලෙස ............................ නම් කළ හැකි ය.
(1) වන්නම් (2) තාලම් (3) සවුදම් (4) වට්ටම්

**5.** එක් මුහුණතක් සහිත අතත භාණ්ඩයක් ලෙස............................ හැඳින්විය හැකි ය.
(1) දවුල (2) ගැටබෙරය (3) රබාන (4) යක්බෙරය

**6.** සතර අභිනය අතුරෙන් ඇඳුම් පැළඳුම් සහ අංග රචනය ...................... අභිනයට අයත් වේ.
(1) සාත්වික (2) වාචික (3) ආංගික (4) ආහාර්ය

**7.** පිළිවෙළින් ශාන්ත, භයානක සහ වීර රසය දැක්වෙන්නේ ................................ ඡායාරූපවල ය.


A


B


C

(1) C, A සහ B (2) A, B සහ C (3) B, A සහ C (4) C, B සහ A


[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

8. 'සිංහල ගැමි නාටකය' ........................................ සූරීන්ගේ කෘතියකි.
(1) ඩබ්ලිව්. බී. මකුලොලුව (2) එදිරිවීර සරච්චන්ද්‍ර
(3) ජේ. ඊ. සේදරමන් (4) සී.ද ඇස්. කුලතිලක

9. "බරත සතර පෙර ඉසිවර කී ලෙසට" යන කවි පදය අයත් වන්නේ .................................... සංදේශයට ය.
(1) සැලළිහිණි (2) පරෙවි (3) කෝකිල (4) සැවුල්

10. 'එදා හෙළදිව' කෘතිය රචනා කරන ලද්දේ ............................................ නම් ඉංග්‍රීසි ජාතිකයා ය.
(1) ජෝන් ඩොයිලි (2) ජෝන් කැලවේ (3) රොබට් නොක්ස් (4) ස්පිල්බර්ජන්

11. 

මෙම රූපයෙහි දැක්වෙන්නේ
(1) ඇම්බැක්කේ ලී කැටයම් ය.
(2) මහනුවර දළදා මාළිගාවේ කැටයම් ය.
(3) ගලපාත විහාරයේ උළුවස්සේ කැටයම් ය.
(4) යාපහුවේ පියගැටපෙළ කැටයම් ය.

12. රණකාමීත්වය මතු කෙරෙන ගායනා විශේෂයකි,
(1) හටන් කවි. (2) කරත්ත කවි. (3) පාරු කවි. (4) කුලු කවි.

13. ප්‍රස්තාරකරණයේ දී **නොඇදෙන** මාත්‍රා හඳුන්වනු ලබන්නේ
(1) ප්ලුත නමිනි. (2) ගුරු නමිනි. (3) ලඝු නමිනි. (4) දෘත නමිනි.

14. කොහොඹා කංකාරියේ දී දිගින් හැට රියනක් වූ මඩුව පළලින්
(1) තිස් රියනකි. (2) එක් රියනකි. (3) මිටි රියනකි. (4) සැට රියනකි.

15. කවිකාර මඩුවෙහි, රජුගේ නෘත්‍ය මණ්ඩලයට වන්නම් රචනා කළ බව කියැවෙන්නේ
(1) ඇහැළේපොල අදිකාරම් ය. (2) මොල්ලිගොඩ අදිකාරම් ය.
(3) එක්නැලිගොඩ අදිකාරම් ය. (4) රම්මොලවක අදිකාරම් ය.

16. දේශීය නර්තන සම්ප්‍රදායවලට පොදු වූ විතත භාණ්ඩයක් ලෙස සැලකෙන්නේ
(1) ගැට බෙරයයි. (2) තම්මැට්ටමයි. (3) රබානයි. (4) යක් බෙරයයි.

- ප්‍රශ්න අංක **17** සහ **18** සඳහා නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරෙන් තෝරන්න.

| | 1 | 2 | 3 |
|---|---|---|---|
| A | දේවකෝල් පාඩුව | මුදුන් තාලය | මංගර |
| B | මල් යහන | පන්දම් පද | කිරි මඩුව |
| C | දෙවොල් මඩුව | දෙවොල් | කොහොඹා කංකාරිය |

17. පහතරට සහ උඩරට ශාන්තිකර්ම දැක්වෙන්නේ
(1) A පේළියේ 1 හා 2 තීරුවල ය. (2) B පේළියේ 2 හා 3 තීරුවල ය.
(3) C පේළියේ 2 හා 3 තීරුවල ය. (4) C පේළියේ 1 හා 3 තීරුවල ය.

18. පහන් මඩුව ශාන්තිකර්මයේ දක්නට ලැබෙන නර්තන අංග දැක්වෙන්නේ
(1) B පේළියේ 2 හා 3 තීරුවල ය. (2) A පේළියේ 1 හා 2 තීරුවල ය.
(3) C පේළියේ 2 හා 3 තීරුවල ය. (4) C පේළියේ 1 හා 2 තීරුවල ය.

19. බලි තොවිල්වල දී රෝගී තැනැත්තා හඳුන්වන්නේ
(1) ආතුරයා නමිනි. (2) කොට්ටෝරුවා නමිනි.
(3) අතෝරකරු නමිනි. (4) යක්දෙස්සා නමිනි.

20. නර්තන ශිල්පිනියන් අතර හිස වෙස් තබා ප්‍රසිද්ධියට පත් කාන්තාවක් වන්නේ
(1) චිත්‍රා අල්ගම මහත්මියයි. (2) සීතා ගමගේ මහත්මියයි.
(3) චන්ද්‍රලේඛා පෙරේරා මහත්මියයි. (4) වජිරා චිත්‍රසේන මහත්මියයි.

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

21. පරයා හා ලෙංචිනා යන චරිත පිළිවෙළින්
(1) කෝලම් සහ සොකරිවලට අයත් වේ.
(2) සොකරි සහ කෝලම්වලට අයත් වේ.
(3) සොකරි සහ නාඩගම්වලට අයත් වේ.
(4) නාඩගම් සහ නූර්තිවලට අයත් වේ.

22. භාරතයේ අඩයාර් හි කලා ක්ෂේත්‍ර ආයතනයෙහි උගන්වනු ලබනුයේ දක්ෂිණ භාරතීය
(1) කථකලි නර්තන සම්ප්‍රදායයි.
(2) මණිපුරි නර්තන සම්ප්‍රදායයි.
(3) කථක් නර්තන සම්ප්‍රදායයි.
(4) භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදායයි.

23. කථකලි නර්තනයට යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ වනුයේ
(1) චෙණ්ඩාව, මෘදංගය හා කයිතාලම් ය.
(2) චෙණ්ඩාව, මෘදංගය හා නටුවාංගම් ය.
(3) චෙණ්ඩාව, මද්දලය හා ඉලතාලම් ය.
(4) උඩැක්කිය, එඩැක්ක හා ඉලතාලම් ය.

24. බටහිර බැලේ නාට්‍ය ඉතාලියේ ආරම්භ වූ අතර වර්තමානයේ වඩාත් ජනප්‍රියව ඇත්තේ
(1) ඉන්දියාවේ ය.
(2) රුසියාවේ ය.
(3) ජපානයේ ය.
(4) එංගලන්තයේ ය.

25. 19 වන සියවස අග භාගයේ වඩාත් ජනප්‍රිය බැලේ රංගය ලෙස සැලකෙන්නේ
(1) නට් ක්‍රැකර් ය.
(2) රෝමියෝ ජුලියට් ය.
(3) සින්ඩරෙල්ලා ය.
(4) හංසවිල ය.

## II කොටස - උඩරට නර්තනය

26. උඩරට නර්තන සම්ප්‍රදායේ වන්නම් ගණන
(1) 18 කි.
(2) 32 කි.
(3) 12 කි.
(4) 16 කි.

27. කුඳ කුජිගත වට්ටමට අදාළ තිත් රූපය වන්නේ
(1) මාත්‍රා 4 තනිතිත ය.
(2) මාත්‍රා 2 + 3 දෙතිත ය.
(3) මාත්‍රා 3 තනිතිත ය.
(4) මාත්‍රා 2 + 4 දෙතිත ය.

28. මාත්‍රා 3 + 4 තාලයට අයත් බෙර පදයක් වන්නේ
(1) දොං ජිං ජිං තකට දොංතක
(2) දොං දොං ජිං ජිං ගජිගත
(3) දොං ජි ජිගත
(4) දොං තකට තත් ගුඳ ගුඳ

29. කොහොඹා කංකාරියේ එන චාරිත්‍ර විධි දෙකක් ලෙස සැලකෙන්නේ
(1) කප් සිටුවීම හා යක් ඇනුමයි.
(2) තොට පේ කිරීම හා හත්පද පෙළපාළියයි.
(3) කප් සිටුවීම සහ තොට පේ කිරීමයි.
(4) යක් ඇනුම හා අස්නයි.

30. ගැටබෙරයෙහි බෙර ඇසෙහි විෂ්කම්භය
(1) වියත්ගුස්සකි.
(2) වියතකි.
(3) රියනකි.
(4) මිටිරියනකි.

31. දහවන (10) ගොඩ සරඹයේ නාමය වන්නේ
(1) පැනීම් සරඹයයි.
(2) බඹර සරඹයයි.
(3) චන්ද්‍රිකා සරඹයයි.
(4) ඇල සරඹයයි.

32. සිංහරාජ වන්නමට අයත් බෙර පදය වන්නේ
(1) දොං දොං ජිං ජිං ජිං ගජිගත
(2) දොං ජිංත ගත දොංත
(3) දො දොංත තකු දොං
(4) දොං ජිං ජිං තකට දොංතක

33. උඩරට අස්න නර්තනය සඳහා භාවිත කරන රංග භාණ්ඩයක් වනුයේ
(1) කොතලයයි.
(2) පොල්මලයි.
(3) බුලත් හුරුල්ලයි.
(4) පොල් පන්දමයි.

34. සැවුලා වන්නමේ දෙවන කවි පාදය ආරම්භ වන්නේ
(1) බර අතගෙන කගින් .... යනුවෙනි.
(2) එම වම් පලුවකින් .... යනුවෙනි.
(3) ඇසුරෙන් කළ යුදින් ... යනුවෙනි.
(4) සුරිඳුන් පෙර සිටන් ..... යනුවෙනි.

35. කොහොඹා කංකාරිය පුරාවෘත්තයේ එන චරිත දෙකකි,
(1) මහා සම්මත රජ හා කුවේණිය.
(2) මහා සම්මත රජ හා මැණික්පාල.
(3) මලය රජ හා කුවේණිය.
(4) මලය රජ හා සේරමාන් රජ.

36. කොහොඹා කංකාරියේ පුද ලබන ප්‍රධාන දෙවිවරුන් වන්නේ
(1) කොහොඹා දෙවි හා දෙවොල් දෙවි ය.
(2) කොහොඹා දෙවි හා බණ්ඩාර දෙවි ය.
(3) වීරමුණ්ඩ දෙවි හා මංගර දෙවි ය.
(4) වීරමුණ්ඩ දෙවි හා දෙවොල් දෙවි ය.

/හතරවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

37. උඩරට වෙස් ඇඳුම් කට්ටලයට අයත් රංග වස්ත්‍රාභරණ වනුයේ
(1) හගල, අවුල්හැරය හා ශිඛාබන්ධනයයි.
(2) හගල, අවුල්හැරය හා රහුකුට්ටමයි.
(3) හේලය, හැට්ටය හා කෙමෙත්තයි.
(4) හේලය, හැට්ටය හා හස්තකඩයයි.

38. කුදාංත ගත දොම් වට්ටම නර්තනය කරනු ලබන්නේ
(1) මාත්‍රා $2 + 2 + 3$ තාල රූපයට ය.
(2) මාත්‍රා $2 + 3 + 4$ තාල රූපයට ය.
(3) මාත්‍රා $3 + 3 + 4$ තාල රූපයට ය.
(4) මාත්‍රා $2 + 2 + 4$ තාල රූපයට ය.

39. "ජෙන් තත් තත් /// .... ජෙන් තා ..." යන අඩව්ව නටනුයේ
(1) හනුමා වන්නමට ය.
(2) සිංහරාජ වන්නමට ය.
(3) සැව්ලා වන්නමට ය.
(4) තුරඟා වන්නමට ය.

40. උඩරට නර්තනයේ දියුණුවට ඇපකැප වූ ප්‍රවීණ නර්තන ශිල්පියෙකි,
(1) ජේ. ඊ. සේදරමන් මහතා.
(2) සිරිබෝහාමි මහතා.
(3) කේ. ඇස්. ප්‍රනාන්දු මහතා.
(4) සව්රිස් සිල්වා මහතා.

## III කොටස - පහතරට නර්තනය

26. පහතරට නර්තන සම්ප්‍රදායේ සිංදු වන්නම් ගණන
(1) 32 කි.
(2) 18 කි.
(3) 12 කි.
(4) 16 කි.

27. තුන් තාලයට අදාළ තිත් රූපය වන්නේ
(1) මාත්‍රා 2 තනිතිත ය.
(2) මාත්‍රා 3 තනිතිත ය.
(3) මාත්‍රා 4 තනිතිත ය.
(4) මාත්‍රා $2 + 3$ දෙතිත ය.

28. මාත්‍රා $3 + 4$ තාලයට අයත් බෙර පදයක් වන්නේ
(1) ගුංද ගතිගත ගත්ත ගුදි ගුඳ
(2) දෙගත් ගතකු දොම්
(3) ගුං දෙගත ගත්ත දොං
(4) දොං දොංගත ගත් දිත්තකු

29. දෙවොල් මඩුවේ එන චාරිත්‍ර විධි ලෙස සැලකෙන්නේ
(1) මඟුල් බෙර වැයීම හා අඹ විදමනයි.
(2) දෙවොල්ගොඩ බැසීම හා කප් සිටුවීමයි.
(3) කප් සිටුවීම හා තොටමෙට යාමයි.
(4) මිල්ල කැපීම හා මුදුන් තාලයයි.

30. පහතරට බෙර ඇසෙහි විෂ්කම්භය
(1) තුන්වියත් තුනඟුලකි.
(2) එක් වියත් තුනඟුලකි.
(3) එක් වියත් දෑඟුලකි.
(4) තුන්වියත් පසඟුලකි.

31. "ගුහිතිග දිරිකිට ගුඳ ගුඳ ගුම් දිත් තා - ගහිතිග දිරිකිට ගත ගත ගත් දිත් තා" - යනු
(1) නමවැනි (9) ඉලංගම් සරඹයයි.
(2) දහවැනි (10) ඉලංගම් සරඹයයි.
(3) එකොළොස්වැනි (11) ඉලංගම් සරඹයයි.
(4) දොළොස්වැනි (12) ඉලංගම් සරඹයයි.

32. අනුරාගදණ්ඩ තාලය සිංදු වන්නමට අයත් බෙර පදය වන්නේ
(1) දොම් තම් ගත ගදිතම් ගත ගුගුදම් ගත ගදිතම්
(2) ගුඳ ගතිගත ගුඳ ගුඳ ගතිගත
(3) තක දිත් තක දොං දොං දිං තක දොං
(4) දිත් තම් දිතකු දොම් දොම් තා

33. පහතරට වඩිග පටුන නර්තනය සඳහා භාවිත කරන රංග භාණ්ඩයක් වනුයේ
(1) විලක්කුවයි.
(2) කලසයි.
(3) කඩුවයි.
(4) කුඩයයි.

34. හනුමන්තා තාලය සිංදු වන්නමේ දෙවැනි කවි පාදය ආරම්භ වන්නේ
(1) නෙත රකිනේ පත් කුහුට රොනේ... යනුවෙනි.
(2) සතරකිනේ දුක් අතු හෙදියේ ... යනුවෙනි.
(3) නිතර රනේගත් සිත හොඳිනේ... යනුවෙනි.
(4) සත තෙදිනේ දෙව්රජ සිරිතේ... යනුවෙනි.

35. දෙවොල් මඩු පුරාවෘත්තයේ එන චරිත දෙකකි,
(1) මහා සම්මත රජ හා මැණික්පාල.
(2) විජය රජ හා කුවේණි.
(3) සේරමාන් රජ හා පත්තිනි දෙවි.
(4) සේරමාන් රජ හා විෂ්ණු දෙවි.

36. දෙවොල් මඩුවේ පුද ලබන ප්‍රධාන දෙවිවරුන් වන්නේ
(1) මංගර දෙවි හා වාහළ දෙවි ය.
(2) පත්තිනි දෙවි හා දෙවොල් දෙවි ය.
(3) දෙවොල් දෙවි හා වීරමුණ්ඩ දෙවි ය.
(4) දෙවොල් දෙවි හා සමන් දෙවි ය.

37. පහතරට දෙවොල් ඇඳුම් කට්ටලයට අයත් රංග වස්ත්‍රාභරණ වනුයේ
(1) හැට්ටය, රැලි සාය හා කාඟුල් කුට්ටමයි.
(2) හැට්ටය, රැලි සාය හා වෙස් මුහුණයි.
(3) හේලය, පච්චවඩම හා කෙමෙත්තයි.
(4) හේලය, පච්චවඩම හා හස්තකඩයයි.

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

38. නාතිලිංචි තාලය නර්තනය කරනු ලබන්නේ
(1) මාත්‍රා 3 + 4 තාල රූපයට ය.
(2) මාත්‍රා 2 + 3 තාල රූපයට ය.
(3) මාත්‍රා 2 + 2 + 3 තාල රූපයට ය.
(4) මාත්‍රා 2 + 4 තාල රූපයට ය.

39. "දොම් තත් දිම් ගත" යන ඉරට්ටිය නටනුයේ
(1) ලලිතරාග තාලය සිංදු වන්නමට ය.
(2) ශුද්ධ තාලය සිංදු වන්නමට ය.
(3) නාතිලිංචි තාලය සිංදු වන්නමට ය.
(4) අනුරාගදණ්ඩ තාලය සිංදු වන්නමට ය.

40. පහතරට නර්තනයේ දියුණුවට ඇපකැප වූ ප්‍රවීණ නර්තන ශිල්පියෙකි,
(1) කේ. ඇස්. ප්‍රනාන්දු මහතා.
(2) සිරිබෝහාමි මහතා.
(3) ජේ. ඊ. සේදරමන් මහතා.
(4) ඒ. ඉඹුල්ගොඩ මහතා.

## IV කොටස - සබරගමු නර්තනය

26. සබරගමු නර්තන සම්ප්‍රදායේ වන්නම් ගණන
(1) 18 කි.
(2) 32 කි.
(3) 12 කි.
(4) 16 කි.

27. යක් පද මාත්‍රයට අදාළ තිත් රූපය වන්නේ
(1) මාත්‍රා 2 තනිතිත ය.
(2) මාත්‍රා 3 තනිතිත ය.
(3) මාත්‍රා 4 තනිතිත ය.
(4) මාත්‍රා 2 + 3 දෙතිත ය.

28. මාත්‍රා 3 + 4 තාලයට අයත් දවුල් පදයක් වන්නේ
(1) ජිංත තක්කිට තකිට ජිංතක
(2) ජිං ජිමිත තත් තකිට
(3) ජිං ජිමිතක තත් කිටිතක
(4) ජිංත ජිමිත්තත් තක්කිට කිටිතක

29. පහන් මඩුවේ එන චාරිත්‍ර විධි ලෙස සැලකෙන්නේ
(1) මගුල් බෙර වැයීම හා අඹ විදමනයි.
(2) දෙවොල්ගොඩ බැසීම හා කප් සිටුවීමයි.
(3) කප් සිටුවීම හා මලපේ කිරීමයි.
(4) මිල්ල කැපීම හා මුදුන් තාලයයි.

30. දවුල් කඳෙහි දිග ප්‍රමාණය වන්නේ
(1) පසළොස් අඟුලකි.
(2) විසි අඟුලකි.
(3) සුවිසි අඟුලකි.
(4) සොළොස් අඟුලකි.

31. කිත් තා කිත් තා ජෙජ් ජං තා - තක්කඩ තරිකිට// ජෙජ් ජං තා ....... යනු
(1) නමවැනි (9) දොඹින පදයයි.
(2) දහවැනි (10) දොඹින පදයයි.
(3) එකොළොස්වැනි (11) දොඹින පදයයි.
(4) දොළොස්වැනි (12) දොඹින පදයයි.

32. විරාඩි වන්නමට අයත් දවුල් පදය වන්නේ
(1) කුඳත් තක්කිට තකට ජිංතක
(2) ජිං කිටිතත් තත් කිටිතක
(3) ජිමිත කුඳා දොං
(4) දොංත තකට

33. සබරගමු පහන් මඩුව දෙවොල් ගොඩබැසීම නර්තනය සඳහා යොදාගනු ලබන රංග භාණ්ඩයක් වනුයේ
(1) පොල්මල ය.
(2) බුලත් හුරුල්ල ය.
(3) අඟුරුකබල ය.
(4) අත් පන්දම් ය.

34. සබරගමු සැව්ලා වන්නමේ පළමු කවි පාදය ආරම්භ වන්නේ
(1) සත්සුන් ලෙස උතුම්.... යනුවෙනි.
(2) ගම්භිර ලත් තාලෙට... යනුවෙනි.
(3) පානා යසසින් පිරි පිරි .... යනුවෙනි.
(4) කොහොව් යනා හඬ .... යනුවෙනි.

35. පහන් මඩුව පුරාවෘත්තයේ එන චරිත දෙකකි,
(1) මහා සම්මත රජ හා මැණික්පාල.
(2) විජය රජ හා කුවේණි.
(3) සේරමාන් රජ හා පත්තිනි දෙවි.
(4) සේරමාන් රජ හා විෂ්ණු දෙවි.

36. පහන් මඩුවේ පුද ලබන ප්‍රධාන දෙවිවරුන් වන්නේ
(1) පත්තිනි දෙවි හා වාහල දෙවි ය.
(2) පත්තිනි දෙවි හා දෙවොල් දෙවි ය.
(3) දෙවොල් දෙවි හා වීරමුණ්ඩ දෙවි ය.
(4) දෙවොල් දෙවි හා කොහොඹා දෙවි ය.

37. සබරගමු දෙවොල් ඇඳුම් කට්ටලයට අයත් රංග වස්ත්‍රාභරණ වනුයේ
(1) හේලය, හැට්ටය හා කාඟුල් ය.
(2) හේලය, හැට්ටය හා වෙස් මුහුණ ය.
(3) හගල, හැට්ටය හා කෙමෙත්ත ය.
(4) හගල, අවුල්හැරය හා හස්තකඩය ය.



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**38.** පට්ටුතාල මාත්‍රය නර්තනය කරනු ලබන්නේ
(1) මාත්‍රා 2 + 3 + 4 තාල රූපයට ය.
(2) මාත්‍රා 3 + 3 + 4 තාල රූපයට ය.
(3) මාත්‍රා 2 + 3 + 3 තාල රූපයට ය.
(4) මාත්‍රා 3 + 2 + 2 තාල රූපයට ය.

**39.** "තහර් රුදගත් ගත ගුදගත්" යන අඩව්ව නටනුයේ
(1) අනිලා වන්නමට ය.
(2) විරාඩි වන්නමට ය.
(3) සැවුලා වන්නමට ය.
(4) මණ්ඩුක වන්නමට ය.

**40.** සබරගමු නර්තනයේ දියුණුවට ඇපකැප වූ ප්‍රවීණ නර්තන ශිල්පියෙකි,
(1) ඩී. වී. හීන්නිලමේ මහතා.
(2) කේ. ඇස්. ප්‍රනාන්දු මහතා.
(3) සව්රිස් සිල්වා මහතා.
(4) ජී. රංගනාත මහතා.

* *



Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

44 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

* **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. **සියලු ම** ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

   (i) 'සැලළිහිණිය' ඉගි නළුව නිෂ්පාදනය කරන ලද්දේ .................................. විසිනි.

   (ii) "ලකල පුළුලුකුළ බැඳි මිණි මෙවුල්ලා" මෙය......................... සංදේශ කාව්‍යයට අයත් කවි පදයකි.

   (iii) සොකරි නාටකයේ ............................ ගේ මෙමෙහෙකරුවා පච්චමීරා නමින් හඳුන්වනු ලැබේ.

   (iv) 'සිංහල නර්තන කලාව' කෘතිය රචනා කර ඇත්තේ මහාචාර්ය .......................................... විසිනි.

   (v) ගොයම් කැපීමේ ගැමි නර්තනය සඳහා යොදා ගන්නා මැටියෙන් කරන ලද වාද්‍ය භාණ්ඩය ........................ නමින් හැඳින්වේ.

   (vi) සිරුරේ කොටස් වන අංග, ප්‍රත්‍යංග, උපාංග මගින් අදහස් දැක්වීම ........................................ අභිනය ලෙස හැඳින්වේ.

   (vii) කථක් නර්තනය සඳහා භාවිත කරන සංගීත සම්ප්‍රදාය ................................ නමින් හැඳින්වේ.

   (viii) 'තු තු' නමින් හඳුන්වන සාය භාවිත කරනුයේ .................... නර්තන කලාවට ය.

   (ix) භරත නාට්‍යම් සහ කථකලි නර්තනය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන අවනද්ධ භාණ්ඩ සඳහන් කරන්න.

   (අ) භරත නාට්‍යම් - ..............................................

   (ආ) කථකලි - ..............................................

   (x) පහත සඳහන් නාට්‍යමය අවස්ථා දක්නට ලැබෙන ශාන්තිකර්ම **දෙක** නම් කරන්න.

   (අ) යක්කම් පහ - ..............................................

   (ආ) පොත්කඩේ පාළිය - ..............................................

2. (i) මාත්‍රා 2 + 3 දෙතිතට අයත් බෙර පදයක් ප්‍රස්තාරගත කරන්න.

   (ii) මාත්‍රා 4 තනිතිතට අයත් රබන් පදයක් ප්‍රස්තාරගත කරන්න.

   (iii) මාත්‍රා 2 + 2 + 4 තුන්තිතට අයත් කස්තිරමක් හෝ ඉරට්ටියක් හෝ කලාසමක් හෝ ප්‍රස්තාරගත කරන්න.

3. පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

   (i) ගැමි නැටුම්

   (ii) රසභාව සංකල්පය

   (iii) වන්නම්වල පොදු ලක්ෂණ

   (iv) මණිපුරි නර්තනයේ රංග වස්ත්‍රාභරණ

   (v) ත්‍රිවිධ ලය

[අටවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**4.** කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව සහ පහන් මඩුව යන ශාන්තිකර්මවල සමාන මෙන් ම අසමාන ලක්ෂණ ද වේ.


(i) කොහොඹා කංකාරියේ එන ගායනා **රහිත** ශාස්ත්‍රීය නර්තන අංග **දෙකක්** හඳුන්වන්න.

(ii) දෙවොල් මඩුවේ හා පහන් මඩුවේ එන නාට්‍යමය පෙළපාළිවල සමානතා හා අසමානතා වගුගත කරන්න.

(iii) ඉහත ශාන්තිකර්ම අයත් නර්තන සම්ප්‍රදායයන් **දෙකක** වාද්‍ය භාණ්ඩවල ව්‍යුහයේ සමානතා හා අසමානතා විමසුමට ලක් කරන්න.

**5.** පහත රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


**A**


**B**

(i) **A** හා **B** ජන නාටක **දෙක** නම් කර, **එක්** ජන නාටකයක එන කවියක් ලියා දක්වන්න.

(ii) **A** රූපයෙන් දැක්වෙන නාටකයේ එන චරිත **හතරක්** නම් කරන්න.

(iii) **B** රූපයෙන් දැක්වෙන නාටකයේ රඟ මඩල පිළිබඳ විස්තරයක් කරන්න.

**6.** 'නර්තනය' බොහෝ කලාවන්ගෙන් සම්මිශ්‍රණය වී පරිපූර්ණ වූවකි.


(i) චිත්‍ර කලාවෙන් නර්තනයට ඇති ප්‍රතිලාභ කෙටියෙන් විස්තර කරන්න.

(ii) 'නර්තනයක' සාර්ථකත්වය උදෙසා සංගීතයෙන් ලැබෙන සහාය අගයන්න.

(iii) නාට්‍ය කලාවේ භාවාත්මක ප්‍රකාශනය සඳහා නර්තනය යොදා ගෙන ඇති ආකාරය විමසුමට ලක් කරන්න.

**7.** පහත රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


**A**


**B**


**C**

(i) **A** රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායට සුවිශේෂී වන වේෂ නිරූපණ ක්‍රම පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ii) **B** රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායට අයත් නර්තනාංග **දෙකක්** නම් කර, වාද්‍ය භාණ්ඩයක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(iii) **C** රූපයේ දැක්වෙන නර්තන කලාවේ විකාශනය පිළිබඳ විමසීමක් කරන්න.

✻ ✻ ✻

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka